# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2105/38 - 2019 ජනවාරි මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2019.01.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

ක්‍රීඩා අමාත්‍යවරයා විසින් 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය යටතේ කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග සහ ඊට වූ සංශෝධන.

හරීන් ප්‍රනාන්දු,
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

ජාතික ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් වන 2016.10.27 දිනැති හා අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2016 අංක 01 දරන නියෝග, 2017.02.13 දිනැති අංක 2006/13 දරන නියෝග, 2017.05.05 දිනැති අංක 2017/41 දරන නියෝග, 2018.09.22 දිනැති අංක 2089/56 දරන නියෝග සහ 2018.10.18 දිනැති අංක 2093/39 දරන නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. 2018.09.22 දිනැති අංක 2089/56 දරන *ගැසට් පත්‍රයෙහි* 3(ඈ) නියෝගය ඉවත්කිරීම මගින් හා පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්

   ''3(ඈ) ඉහත දක්වා ඇති පරිදි නිලවරණ කමිටුව පත්කිරීමෙන් අනතුරුව ; නිලවරණ කමිටුව පත්කිරීමේ දිනයේ සිට මාස දෙකක කාලයක් ඇතුළත නාමයෝජනා කැඳවිය යුතු ය.''

2. 2018.09.22 දිනැති අංක 2089/56 දරන *ගැසට් පත්‍රයේ* 8(2) නියෝගය ඉවත් කිරීම මගින් හා පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්

   ''8(2) ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව 'A' හා 'B' ශ්‍රේණියේ සංගමයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකු හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකුගේ සභාපතිත්වයෙන් හා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල උපදේශක මණ්ඩලයක් වෙත සහ 'C' ශ්‍රේණියේ සංගමයක් සම්බන්ධයෙන් ගත්කළ, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත උපදේශක මණ්ඩලයකට එකී අභියාචනය ඉදිරිපත් කළයුතු අතර එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් කමිටුව තම තීරණය, සමාලෝචනය පිණිස ලද එකී අභියාචනය යොමුකළ දිනයේ සිට සතියක් (දින 07ක්) ඇතුළත ලිඛිතව ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාට දැන්විය යුතු ය.''

01 - 650

1A - PG 4353 — 517 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*